## 216 ලබා ගන්න සදාකාල ජීවිතේ

ලබා ගන්න සදාකාල ජීවිතේ
කියා දෙන්නැ කියා දෙන්නැ මා කළ යුතු දේ
ලබා ගන්න සදාකාල ජීවිතේ
කියා දෙන්නැ ජේසු සමිඳුනේ

කවුරුද ඒ ජේසුතුමන් මෙසේ ඇමතුවේ
නැමී වැටී දෙපා මුලේ එතුමාණන්ගේ
දනවතෙකි මහා එසේ විමැසුවේ
එහෙත් අනේ කලකිරිලා ඇයිදැ ඔහු ගියේ

අනුවැ ගියෙමි දේව පනත් සිටැ යොවුන් වියේ
එයට වැඩියෙ කුමක්දැ මා සමිඳෙ කරන්නේ
දිළිඳුනට පුදා ඔබ සතු සැම දේ
එන්නැ එන්නැ හිස් අතින් මැ මා පසු පස්සේ

ජේසුතුමන් කී මෙවදන් ඇසූ පොහොසතා
මිලානවී කරබාගෙනැ ගියේයැ පසු බා
සමිඳු මෙත් වඩා උන් ගැනැ මැ සිතා
ඔවා මුවින් වදාලෝයැ, මෙකරුණු හැරුපා

ඇහැකි වුනත් ඔටුවකු හට යන්නට රිංගා
ඉඳිකටු සිදුරෙකින් වුවද සැකයට කම් නැ
ඒ එසේ නමුත් පොහොසතකුට නම්
මෝක්ෂයට ඇතුළුවීම ලෙහෙසි වන්නෙ නැ

දැන් මුල් තැන් ගෙනැ ඉන්නෝ වෙති අන්තිමයෝ
අද අන්තිමයෝ ඉදිරියෙ වෙති මූලිකයෝ
අපට සව්ය නැ කරනට හැමදේ
අපව මැවූ දෙවිඳුට කළ හැකිය සියලු දේ